ප්‍රවෘත්ති NEWS

විදේශ සේවා නියුක්ති කාර්යාංශය

Sri Lanka Bureau of Foreign Employment

Tel : 2872124 Fax 2872124 Email-slbfemedia@gmail.com slbfemedia2010@gmail.com

# කාර්යාංශ සේවාවන් කඩිනම් කෙරේ

23.09.2016

මාධ්‍ය ඒකකය



විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවාවන් ලබාගැනීමට පැමිණෙන, විදෙස් ගතවීමට පැමිණෙන අයට, විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ගැටළු සම්බන්ධව, විදේශ රැකියා ඒජන්සි ආයතන වෙනුවෙන් කඩිනම් සේවාවන් ලබාදෙන ලෙස විදේශ රැකියා අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මිය විසින් කාර්යාංශ නිළධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. අමාත්‍යතුමිය මේ උපදෙස් ලබාදුන්නේ පසුගියදා කාර්යාංශයේ වයඹ පළාත් කාර්යාලයේ නිරීක්ෂණ චාරිකාවකට එක්වෙමිනි.

කොළඹ ප්‍රධාන කාර්යාලයට සේවාවන් ලබාගැනීමට පැමිණෙන පිරිසට සාපේක්ෂව ඉන්පසුව වැඩියෙන් පුද්ගලයින් පැමිණෙන්නේ කුරුණෑගල පිහිටි වයඹ පළාත් කාර්යාලයට බවත්, එසේ පැමිණෙන පිරිසට අවශ්‍ය සේවාවන් හා පහසුකම් නොපැකිලව ලබාදීමට කටයුතු කරන ලෙසද අමාත්‍යතුමිය විසින් නිළධාරීන්ට උපදෙස් ලබාදුන්නාය. බොහෝ දුරබැහැර ප්‍රදේශවල සිට පැමිණෙන අය වෙනුවෙන් මෙසේ සේවාවන් ලබාදීමේදී ඒ අයගේ අවශ්‍යතාවය හරිහැටි හඳුනාගෙන කටයුතු කරන ලෙසත්, ඒ සම්බන්ධව තමන් පෞද්ගලිකව සොයාබලන බවත්, අමාත්‍යතුමිය සඳහන් කළාය. මෙරටට වැඩියෙන් ආදායම් ලැබෙන්නේ තම අමාත්‍යාංශය හරහා බවත්, ඒ නිසා ජනතාවට සේවාවන් ලබාදීමේදී වෙනදාට වඩා කාර්යක්ෂම සේවාවන් ලබා දෙනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවත් අමාත්‍යතුමිය සඳහන් කළාය.

මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ නීතිඥ උපුල් දේශප්‍රිය, අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික මොහොමඩ් රියාල් යන මහත්වරුන් ඇතුළු පිරිසක් එක්වී සිටියහ.



## ඇතුළත


- *කාර්යාංශ සේවාවන් කඩිනම් කෙරේ..* 1
- *යුරෝපා රැකියා ලබාදෙන බව පවසා මුදල් වංචාකල අයෙකු අත්අඩංගුවට...* 2
- *විදෙස් ශ්‍රමිකයින් එවූ ප්‍රේෂණ වැඩිවේ...* 3
- *ව්‍යාජ පවුල් පසුබිම් වාර්තා සකස් කල සංවර්ධන නිළධාරියෙකු අත්අඩංගුවට...* 4

# යුරෝපා රටවල රැකියා ලබාදෙන බව පවසා මුදල් වංචාකල අයෙකු අත්අඩංගුවට

විදේශ රැකියා අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මියට ලද තොරතුරක් මත, කැනඩාව, ජපානය, බෲනායි, ඔස්ට්‍රියා යන රටවල රැකියා ලබා දෙන බව පවසා තරුණයින් 62 දෙදෙනෙකුගෙන් මුදල් වංචාකල පුද්ගලයෙකු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයේ නිළධාරීන් හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ නිළධාරීන් විසින් පසුගියදා අත්අඩංගුවට ගන්නා ලදී.

බුළුගල වලව්ව, බුළුගල, කුරුණෑගල යන ලිපිනයේ පදිංචි 65 හැවිරිදි මෙම සැකකරු රිදීගම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රිවරයෙකු වන අතර, තැපැල් ස්ථානාධිපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත. මොහු විසින් රැකියා අපේක්ෂිත තරුණයින්ට පවසා ඇත්තේ යුරෝපා රැකියා සඳහා කාර්යාංශයට ලැබෙන රැකියා කෝටා තමන්ට ලැබෙන බවත්, එම රැකියා ලබාගැනීම සඳහා එක් අයෙකුගෙන් රුපියල් 450,000 ක මුදලක් අවශ්‍ය බවයි. ඒ සඳහා රුපියල් ලක්ෂ එක හමාරක ණය මුදලක් රජයේ බැංකු මගින් ලබාදෙන බවත් පවසා ඇත. එසේම මූලිකව රුපියල් 56,000ක මුදලක් අවශ්‍ය බවත්, එය තමන්ගේ බැංකු ගිණුමෙහි තැන්පත් කරන ලෙසත් පවසා ඇත.

ඒ අනුව කාර්යාංශ නිළධාරීන් උපාය දූතයෙකු මාර්ගයෙන් සැකකරු හා සම්බන්ධ වී යුරෝපා රැකියාවක් ඉල්ලා ඇති අතර, අවශ්‍ය මුදල් සවස ඔහුගේ නිවසට රැගෙන එන ලෙස දන්වා ඇත. විමර්ශන නිළධාරීන්, සැකකරුට මුදල් ලබාදුන් පුද්ගලයින් හා මුදල් ලබාදීමට බලාපොරොත්තු වූ පුද්ගලයින් සමඟ සැකකරුගේ නිවසට ගොස් ඇත. එහිදී ඔහු අත්අඩංගුවට ගෙන ඇති අතර, එහිදී තරුණයින් රැසකගේ ජීවදත්ත සටහන්ද තිබී අත්අඩංගුවට ගෙන ඇත.



මූලික විමර්ශන වලින් අනාවරණය වී ඇත්තේ ජපානයේ රැකියා ලබා දෙන බව පවසා පුද්ගලයින් 18 දෙනෙකුගෙන්, බෲනායි රැකියා ලබා දෙන බවට පුද්ගලයින් 35 දෙනෙකුගෙන් හා ඔස්ට්‍රියා රැකියා ලබා දෙන බව පවසා පුද්ගලයින් 8 දෙනෙකුගෙන් මුදල් ලබාගෙන ඇති බවයි. මීට අමතරව කොරියාව, ඇමරිකාව වැනි රටවලටද තරුණයින් යැවීමට ජීවදත්ත සටහන් රැස්කර ඇත.

මෙම වංචාව කලක පටන් ක්‍රියාත්මකවී ඇති අතර, මොහුට තරුණයින් හඳුන්වා දුන් පුද්ගලයින් සම්බන්ධවද පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. ඊයේ දින විශේෂ විමර්ශන ඒකකය විසින් සැකකරු කුරුණෑගල පොලිසියට ඉදිරිපත් කල අතර ඔහු කුරුණෑගල පිලැස්ස අධිකරණයට ඉදිරිපත් කර තිබේ.

මෙම වැටලීම සඳහා කාර්යාංශයේ විමර්ශන ඒකකයේ පොලිස් පරීක්ෂක ලක්ෂමන් බණ්ඩාර, පොලිස් සැරයන් එස්.ඩබ්.මුණසිංහ, කාර්යාංශ නිළධාරී ඩබ්.ඒ.නාමසේන, අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ මාධ්‍ය ලේකම් නලින් රාජපක්ෂ, රොෂාන් ගුණරත්න, සතිරු රිද්මික යන මහත්වරුන් එක්වී සිටියහ.

# විදෙස් ශ්‍රමිකයින් එවූ ප්‍රේෂණ වැඩිවේ...





පසුගිය වසරේ ජූනි මාසය හා සැසඳීමේදී මේ වසරේ ජූනි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සියයට 2.4 ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ. ඒ හේතුවෙන් මේ වසරේ පළමු භාගයේදී විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත වර්ධනය පසුගිය වසරේ මුල් මාස 6ට සාපේක්ෂව සියයට 5.3ක් විය.

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීමට හේතුව වී ඇත්තේ මැදපෙරදිග රටවල මන්දගාමී ආර්ථික වර්ධන වේගය හා නුපුහුණු ශ්‍රමිකයින් යටතේ වන ශ්‍රම සංක්‍රමණ අඩුවීමයි.

මේ අනුව 2016 වසරේ පළමු මාස 6 තුළදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් පසුගිය වසරේ එම කාලයට සාපේක්ෂව ඇමරිකන් ඩොලර් මිලියන 3613.1 බව ශ්‍රී ලංකා මහබැංකු වාර්තා පෙන්වා දෙයි.



# ව්‍යාජ පවුල් පසුබිම් වාර්තා සකස් කල සංවර්ධන නිළධාරියෙකු අත්අඩංගුවට...

සෞදි අරාබියට ගෘහ සේවිකාවක් ලෙස විදේශ ගත වීමට පැමිණි කාන්තාවක්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිළධාරීන්ට පවසා ඇත්තේ තමන් මාස 3ක ගැබිණියක් බවත්, තමන් බලහත්කාරයෙන් විදෙස් ගත කිරීමට උත්සාහ කරන බවත්ය. ඒ අනුව මේ සම්බන්ධව වැඩිදුර විමර්ෂණ කටයුතු ඇරඹූ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ෂණ ඒකකය විසින් මෙම කාන්තාව විදේශ ගත කිරීමට අවශ්‍ය පවුල් පසුබිම් වාර්ථාව ව්‍යාජ ලෙස සකසමින් එය සනාථ කිරීමට කෙටි පණිවුඩය යොමු කළ විදේශ රැකියා අමාත්‍යංශයට අනුයුක්ත, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිළධාරියෙකු පසුගියදා අත්අඩංගුවට ගැනීමට සමත් වුනි.

මෙහිදී විශේෂ විමර්ෂණ ඒකකය විසින් වැඩිදුර විමර්ෂණ වලදී අනාවරණය වූයේ විදේශ ගත වීමට උත්සාහ කළ මෙම කාන්තාව මාතලේ ප්‍රදේශයේ පදිංචිකාරියක වුවද, ඇය විදේශ රැකියාව සඳහා ලියාපදංචි කර ඇති ලිපිනය කොළඹ ප්‍රදේශයේ ලිපිනයක් බවත්ය. එසේම ඇය පවුල් පසුබිම් වාර්ථාව කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගෙන ඇති බවත්, ඒ අනුව මෙම පවුල් පසුබිම් වාර්ථාව නිවැරදි බවට තහවුරු කර කෙටි පණිවුඩය යොමු කර ඇත්තේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී ඩී.සී.එන්.එස් කුමාර යන තැනැත්තා විසින් බවට අනාවරණය වී තිබේ.

ඒ අනුව ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධව, අංක.42, වැල්ලමණ්ඩිය, ගවරගිරිය, අයගම යන ලිපිනයේ පදිංචි ඩී. සී. එන්. එස් කුමාර නමැති පුද්ගලයා අත්අඩංගුවට ගන්නා ලදි. 2009 අංක 56 දරණ පණතින් සංශෝධිත 1985 අංක 21 දරණ කාර්යාංශ පණතේ වගන්ති 62 (1) (ආ) සහ 63 (ආ) ප්‍රකාරව දඩුවම් ලැබිය හැකි වරදක් බැවින්, 2016.09.19 දින එම තැනැත්තා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදි.



මෙම වැටලීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කීර්ති මුතුකුමාරණ මහතාගේ සහ විශේෂ විමර්ශන ඒකකයේ කළමණාකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක අර්ජුන මාහින්කන්ද මහතාගේ උපදෙස් පරිදි, පොලිස් පරීක්ෂක ඩබ්. ඒ බාලසූරිය, පොලිස් සැරයන් ඩී. එම්. ඩබ්. ඒ. බී දිසානායක මහතා විසින් සිදුකරන ලදි.


**ප්‍රකාශනය**

මාධ්‍ය ඒකකය

ප්‍රචාරක හා මහජන සම්බන්ධතා අංශය

**දුරකතන/ෆැක්ස්**

0112864150

154 / 111

**ඊමේල්**

slbfemedia2010@gmail.com

slbfemedia@gmail.com